## ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුම

මෙහි වගන්ති දොළහක් විය. එම වගන්ති අතුරින් කිහිපයක් මෙසේ ය.

- 1 , 2 , සහ 3 වගන්ති වලින් කියවුනේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දුර්දාන්ත පාලකයකු බවත් ඔහු රජ පදවියෙන් පහකරනු ලැබූ බවත් ඔහුගේ ඥාතීන්ට සිහසුනේ අයිතිය අහිමි කරන බවත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පිරිමි ඥාතීන්ට බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ බලපත්‍රයක් නොමැතිව උඩරටට ඇතුළු වීම තහනම් බවත් ය.
- 4 වගන්තිය අනුව ඉංග්‍රීසි ආණ්ඩුවට යටත් වූ උඩරට රාජ්‍යය දේශීය නිලධාරීන්ගේ ද ජනතාවගේ ද අයිතිවාසිකම්, බලතල සහ වරප්‍රසාද ආරක්ෂා වන පරිදි දේශීය සිරිත් විරිත් අනුව පාලනය කිරීමට ඉංග්‍රීසීන් පොරොන්දු වී ඇත.
- 5 වගන්තිය අනුව බුද්ධ ශාසනය ද දේවාගම ද කඩ නොකොට පවත්වා ගනිමින් සංඝයා වහන්සේ ද විහාරස්ථාන ද ඒවායේ දේපල ද ආරක්ෂා කිරීමට ඉංග්‍රීසීන් පොරොන්දු වී ඇත.
- 6 වන වගන්තිය අනුව අංග ඡේදනය වැනි දඬුවම් තහනම් කරනු ලැබී ය.
- 7 වගන්තිය අනුව ආණ්ඩුකාරයා විසින් ලබා දෙන බලපත්‍රයක් නැති කිසිවකුට හෝ මරණ දඬුවම පැමිණවිය නොහැකි බව ප්‍රකාශයට පත් කොට ඇත.
- 8 වගන්තිය අනුව වැසියන්ගේ සිවිල් හා අපරාධ නඩු හබ විසඳීම ව්‍යවහාරයේ පවතින පරිදි රදළ ප්‍රධානීන් වෙත පවරා ඇත.

ඒ අනුව ක්‍රි. ව. 1815 දී ඉංග්‍රීසීන් උඩරට රාජ්‍යය අත්පත් කොට ගැනීමට සමත් වූයේ දේශීය පරිපාලන ක්‍රමය සහ අධිකරණ ක්‍රමය ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක කරන බවටත් දේශීය රජවරුන් කළ ආකාරයට බුද්ධාගම ආරක්ෂා කොට පවත්වා ගන්නා බවටත් පොරොන්දු වීම වැනි කොන්දේසිවලට යටත් ව බව පැහැදිලිය.

## බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර

බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට ක්‍රියා කළ අවධියේ ම ඔවුන්ට විරුද්ධව දේශීය ජනතාව ගෙනගිය ව්‍යාපාර තුනක් ඉතිහාසයෙහි සටහන්ව ඇත. ඒවා නම්,

- ක්‍රි. ව. 1797-1798 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට විරුද්ධව සිදු කළ උද්ඝෝෂණය
- ක්‍රි. ව. 1818 උඩරට පළමුවන නිදහස් සටන
- ක්‍රි. ව. 1848 විමුක්ති අරගලය

අපි පළමුව ක්‍රි. ව. 1797- 1798 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට විරුද්ධව පැවති ව්‍යාපාරය ගැන තොරතුරු පරීක්ෂා කොට බලමු.

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ක්‍රි. ව. 1796 දී අත්පත් කොට ගැනීමේ කාර්යය සඳහා ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් විශාල මුදලක් වැය කරන ලදී. වෙළෙඳ සමාගමේ ප්‍රධාන අභිප්‍රාය වූයේ හැකි තාක් ලාභ ඉපයීමයි. ඒ නිසා වැය කළ මුදලට අමතර ව ලාභයක් ලබා ගැනීමට කටයුතු කිරීම වෙළෙඳ සමාගමේ ප්‍රයත්නය විය. අනෙක් අතට යුරෝපයේ පැවති තත්ත්වය යටතේ සමාගම විසින් අල්ලාගත් ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ආපසු ලන්දේසීන් වෙත බාර දීමට සිදු වේ ය යන සැකයක් ද ආරම්භයේ දී ඉංග්‍රීසි සමාගමට තිබිණි. මෙම තත්ත්වය යටතේ හැකි තාක් ඉක්මනින් වැඩි ආදායමක් එකතු කොට ගැනීමට සමාගම කටයුතු කෙළේ ය. මේ සඳහා ඉංග්‍රීසි වෙළෙඳ සමාගම ගත් පියවර කිහිපයකි.

- දේශීය නිලධාරීන් වෙනුවට ඉන්දියාවෙන් ගෙන්වන ලද අවුමිල්දාර්වරුන් නමින් හැඳින්වූ නිලධාරීන් බදු එකතු කිරීමට යෙදවීම,
- එවක මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පැවති අස්වැන්නෙන් හා එලදාවෙන් කොටසක් බදු වශයෙන් ගෙවීමේ ක්‍රමය අහෝසි කොට මුදලින් බදු ගෙවන ක්‍රමයක් ආරම්භ කිරීම,
- පොල් ගස් දහයකට වැඩි අයිතිකරුවන් විසින් මුදලින් ගෙවිය යුතු නව පොල් ගස් බද්දක් පැනවීම,

ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ ඉහත කී ක්‍රියාකලාපය මුහුදුබඩ ප්‍රදේශවල මහජනතාවගේ බලවත් අප්‍රසාදයට හේතු විය. ඉන්දියාවෙන් ගෙන්වාගෙන මෙහි බදු එකතු කිරීමට පත් කළ නිලධාරීන් මෙරට භාෂාව, සංස්කෘතිය හා සිරිත් විරිත් දැන සිටියේ නැත. ඔවුන්ගේ එකම අභිමතාර්ථය වූයේ හැකිතාක් සමාගමට බදු එකතු කොට දීම යි.

මුහුදුබඩ ප්‍රදේශයෙහි බොහෝ අයට පොල් ගස් දහයකට වඩා හිමි වී තිබිණි. බොහෝ විට ගස් ප්‍රමාණයට අනුව බදු ගෙවීමේ ක්‍රමය යටතේ පාළු ගස්වලට ද බදු ගෙවන්නට සිදු විය. තව ද ශ්‍රී ලංකාවේ බහුලව මුදල් භාවිතයක් නොපැවති තත්ත්වයක් යටතේ මුදලින් බද්දක් ගෙවීමට නියම කිරීම ජනතාවට කරන ලද විශාල කරදරයක් විය.

මෙම තත්ත්වය යටතේ ක්‍රි.ව. 1797 එනම් ඉංග්‍රීසීන් බලය අල්ලාගෙන එක් වර්ෂයක් වැනි කෙටි කාලයක් ඉකුත්වෙද් දී ඔවුන්ට විරුද්ධව මුහුදුබඩ ප්‍රදේශයේ විරෝධයක් මතු විය. මෙයට බලතල අහිමි ව සිටි ලන්දේසි නිලධාරීන්ගේ ද සහයෝගය ලැබුණ බව විශ්වාස කෙරේ. උඩරට රජු ද ඉන්දියාවෙන් පිරිස ගෙන්වා ගෙන කැරැල්ලට සහාය දුන්නේ ය. ඉංග්‍රීසි සමාගමේ පාලකයෝ තුවක්කුවල සවිය යොදා විරෝධය මර්දනය කළහ. එබැවින් කැරැල්ල අසාර්ථක විය. **එම අසාර්ථකත්වයේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ ඉංග්‍රීසීන්ගේ බලය ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල තහවුරු වීම යි.**

මෙම සිද්ධිය ගැන සොයා බලා වාර්තා කරන ලෙස "ද මියුරන්" ගේ ප්‍රධානත්වයෙන් කොමිසමක් බ්‍රිතාන්‍යයෙන් මෙරටට එවන ලදී. මෙම කොමිසම විසින් ඉංග්‍රීසි වෙළෙඳ සමාගමේ ක්‍රියාකලාපය අසාධාරණ බව තීරණය කරන ලදී. සමාගම විසින් ක්‍රියාත්මක

කොට තිබූ බඳු ප්‍රතිපත්තිය අවලංගු කරන ලෙස සමාගමට නියම කෙරිණි. තව ද වඩා හොඳ සිවිල් පාලනයක් සඳහා ඉංග්‍රීසි ආණ්ඩුවේ මැදිහත් වීමක් අවශ්‍ය බව තීරණය කළ අතර ඉංග්‍රීසි ආණ්ඩුව වෙනුවෙන් සමාගම සමඟ පාලන කටයුතු ගෙනයාම සඳහා ආණ්ඩුකාරයකු මෙරටට එවනු ලැබී ය. ඒ අනුව ක්‍රි.ව. 1798 දී ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා ලෙස ෆ්‍රෙඩ්රික් නෝර්ත් පත් කරනු ලැබී ය.

බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාරයේ ඊළඟ අවස්ථාව වූ ක්‍රි.ව. 1818 නිදහස් සටන ගැන දැන් අධ්‍යයනය කරමු.

## 1818 නිදහස් සටන

බ්‍රිතාන්‍යයන් යටතට පත් වූ උඩරට ප්‍රදේශවල පාලනය ගෙන යාම සඳහා ආණ්ඩුකාරයා විසින් සිය නියෝජිතයා ලෙස රෙසිඩන්ට් හෙවත් නිත්‍ය නේවාසික නිලධාරියකු පත්කරන ලදී. එම තනතුරට මුලින්ම පත් වූයේ උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් විසින් යටත්කොට ගැනීමේ දී විශාල මෙහෙයක් ඉටු කළ ජෝන් ඩොයිලි ය.

උඩරට රාජ්‍යය අත්පත් කොට ගැනීමට ඉංග්‍රීසීන්ට ඉඩදීම ඉතිහාසයේ සිදු වූ වරදක් බව උඩරටියන්ට අවබෝධ වන්නට වැඩි කාලයක් ගත නොවී ය.

1818 නිදහස් සටනට තුඩුදුන් හේතු කිහිපයකි

- උඩරට පොදු මහ ජනතාව පමණක් නොව සියලු ජන කොටස් කාලාන්තරයක් පුරා පුරුදුව සිටි තමා ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටින රජ කෙනෙකුට පක්ෂපාතීව කටයුතු කිරීම හා ඔවුන් විසින් ගෞරවාදරය කරන ලද්ද වූ ද ශ්‍රේෂ්ඨ සභ්‍යත්වය සමඟ ගසට පොත්ත මෙන් බැඳී සිටියා වූ ද රජු අහිමි වීම හේතු කොට සමස්ත ජනතාව තුළ පැන නැගි කනස්සල්ල,
- දේශීය භාෂාව හෝ සිරිත් විරිත් පිළිබඳව කිසිදු දැනුමක් නැති ඉංග්‍රීසීන් අතට පාලන කටයුතු පත් වීම නිසා රට තුළ ඇති වූ ව්‍යාකූලත්වය,
- භික්ෂූන් වහන්සේලා රදළ ප්‍රධානීන් සහ සාමාන්‍ය ජනතාව යන ජන කොටස් අතර ඉංග්‍රීසි ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදයක් ගොඩ නැගීම යනාදිය ඒ අතර ප්‍රධාන වේ.

## මහජනතාව කනස්සල්ලට පත් වීම

ඉංග්‍රීසීන් විසින් උඩරට අල්ලාගත් පසු ඉංග්‍රීසී හේවායන් සහ ඔවුන් සමඟ පැමිණි පිරිස් දේපල සහ හරක බාන කොල්ල කෑම නිසා ජනතාව පීඩාවට පත්විය.

උඩරට ජනතාවට විශේෂයෙන් උඩරට රජු ඉදිරියේ තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සහ තම රජු නිතර දැක බලා ගැනීමට ද අවස්ථා තිබිණි. එහෙත් ක්‍රි. ව. 1815 පසුව ඔවුන්ට සිටියේ සැතපුම් දහස් ගණනක් දුර රටක වාසය කළ නිතර දෙවේලේ දකින්නට හෝ තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට හෝ අවස්ථාවක් නැති රජ කෙනෙකි. එය උඩරට ජනතාවට නුහුරු නුපුරුදු දෙයක් පමණක් නොව අවාසි සහගත තත්ත්වයක් ද විය.

උඩරට රජු අහිමි වීම නිසා කනස්සල්ලට පත් වූයේ සාමාන්‍ය ජනතාව පමණක් නොවේ. ක්‍රි. ව. 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව තමන්ගේ ගම් ප්‍රදේශය බලා ගිය කුංකුනාවේ භික්ෂුව ස්වකීය රජු පෙරමුණේ තබාගෙන ගමන් කළ

කුහුඹුවන් රැළක් දැකීමෙන් මිනිසුන් බව කියන පහත සඳහන් කවියෙන් පැහැදිලි වන්නේ උඩරට සියලු ජන කොටස් තම රජු අහිමි වීමෙන් කනස්සල්ලට පත් වූ බව යි.

'අනේ කුඹියනේ
තොපටත් රජෙක් ඉන්නේ
අපට නෑ ඉන්නේ
අපේ කරුමේ අපට වන්නේ
රජෙක් ලැබුණොතින්
කැවුම් කිරිබත් කන්නම්
පෙරහැර කරන්නම්
සාදුනාදෙන් ගිගුම් දෙන්නම්

## භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි ආණ්ඩුව කෙරෙහි කළකිරීම

ලාංකික සමාජයේ සියලු ජන කොටස් භික්ෂූන් වහන්සේලාට මහත් ගෞරවයෙන් පුද සත්කාර දැක්වීම ඉතිහාසය පුරාම සිදු වූවකි. රදළයන්ගෙන් පමණක් නොව මහරජුන්ගෙන් ද භික්ෂූන් වහන්සේලා වැඳුම් පිදුම් ලැබූහ. එහෙත් ඉංග්‍රීසි පාලනය යටතේ උන්වහන්සේලා නොසලකා හරින ලදහ. ක්‍රි.ව. 1815 ගිවිසුමෙන් පොරොන්දු වූ පරිදි බුදු සසුනේ ආරක්ෂාවට ඉංග්‍රීසීන්ගෙන් අනුග්‍රහ නො ලැබිණි. ක්‍රිස්තුභක්තිකයන් වූ ඉංග්‍රීසීන්ට සිංහල රජවරුන් මෙන් භික්ෂූන් වහන්සේලාට ගෞරව කිරීම හෝ වැඳුම් පිදුම් කිරීම කළ නොහැකි විය. ක්‍රි.ව. 1815 ගිවිසුමෙන් ලබා දුන් පොරොන්දු ගිවිසුමට පමණක් සීමා වූ බව පෙනී යන්නට විය. එය භික්ෂූන් වහන්සේලා තුළ ඉංග්‍රීසි පාලකයන් කෙරෙහි අප්‍රසාදයක් ගොඩනැංවීමට හේතු විය.

## රදල ප්‍රධානීන්ට පහර වැදීම

පිළිමතලව්වේ අදිකාරම්ගෙන් පසු උඩරට ආක්‍රමණය සඳහා ඉංග්‍රීසින්ට බෙහෙවින් ම උපකාර කෙළේ ඇහැලේපොල අදිකාරම් ය. ඔහු සිතා සිටියේ ඉංග්‍රීසීන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජ බලයෙන් පහකිරීමෙන් පසුව රජකම තමන්ට පවරා දෙනු ඇති කියා ය. කාලයක් තිස්සේ උඩරට රාජාණ්ඩුව යටතේ රදළයෝ බොහෝ වරප්‍රසාද සහ ගරු බුහුමන් සහිතව විසූහ. එසේ ම නින්දගම්වලින් ආදායම් ද ලැබූහ. එහෙත් ක්‍රි.ව. 1815න් පසුව, මේ තත්ත්වය වෙනස් වී ගිවිසුමෙන් පොරොන්දු වූ පරිදි ඉංග්‍රීසි උසස් නිලධාරින් තබා සාමාන්‍ය සොල්දාදුවෝ පවා රදළ ප්‍රධානීන්ට ගරු බුහුමන් නො දැක්වූහ. සාම්ප්‍රදායානුකූලව පරම්පරාවට හිමි වූ නිලතල ද ආණ්ඩුකාරයාගේ කැමැත්ත පරිදි වෙනස් කෙරිණි. ඒ නිසා බොහෝ පරම්පරාගත රදළ ප්‍රධානීන්ට තනතුරු අහිමි විය. ඒ නිසාම ඔවුන්ගේ වරප්‍රසාද සහ ආදායම ද අඩු විය. මෙය රදළ ප්‍රධානීන්ට ඉවසුම් නොදෙන තත්ත්වයක් විය. මේ අතර ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ විසූ රදළයන් විසින්

කලින් භුක්ති විඳින ලද වරප්‍රසාද තවත් අඩුවන සිද්ධියක් ක්‍රි.ව. 1815 ට ආසන්නයේ ම සිදු විය. එනම් මුස්ලිම් ජනයා වෙනුවෙන් හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් ජාතිකයා මුහන්දිරම් තනතුරට පත් කිරීම යි. චිරාත් කාලයක් තිස්සේ උඩරට රාජ්‍යය තුළ ක්‍රියාත්මක වූ සම්ප්‍රදාය වූයේ සිංහල රදළවරුන් පමණක් සියලුම උසස් තනතුරුවලට පත් කිරීමයි. එහෙත් ඉංග්‍රීසීන් උඩරට ගිවිසුමට ද පිටුපා එම සම්ප්‍රදාය කඩ කිරීම සම්බන්ධයෙන් විරුද්ධ වූ සිංහල රදලවරු බ්‍රිතාන්‍යය රජය සමග අමනාප වූහ.

## නිදහස් සටනේ ආරම්භය සහ ව්‍යාප්තිය

### සිහසුනට උරුමකරුවකු ඉදිරිපත් වීම

ඉහත සඳහන් හේතුවල බලපෑම නිසා උඩරට සියලු ජන කොටස් අප්‍රසාදයට පත් වී පසුතැවිලි වෙද් දී උඩරට රාජ්‍යයට උරුමකම් ඉදිරිපත් කළ පුද්ගලයකු ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් මතු විය. ඔහු දොරේසාමි නමින් හැඳින්විණි. භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ද ප්‍රාදේශීය රදල ප්‍රභුවරුන් ද වැදි ජනතාව ද සාමාන්‍ය ජනතාව ද එකතු කොට ගෙන තම උරුමය ලබා ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරන්නට ඔහු පටන් ගෙන තිබිණි. ඒ බව දැන ගත් ඉංග්‍රීසි පාලකයන් විසින් දොරේසාමි අල්ලා ගැනීමට හමුදා යැවීමත් සමඟ ගැටීම් ආරම්භ විය.

## කැප්පෙටිපොළ දිසාවේගේ නායකත්වය

ඉංග්‍රීසීන් යටතේ සේවය කළ කැප්පෙටිපොළ දිසාව සටන මැඩ පැවැත්වීමට ඌවට යවනු ලැබී ය. එකල බලවත් දේශීය නායකයකු වූ ඔහු යොදවා සටන පරාජය කිරීම ඉංග්‍රීසීන්ගේ අපේක්ෂාව විය. එහෙත් ඉංග්‍රීසීන්ගේ අපේක්ෂාව සුන් කරමින් තමා සමඟ ගිය ඉංග්‍රීසි හේවායන් ද ඔවුන් විසින් රැගෙන යන ලද ආයුධ ද ආපසු එවූ කැප්පෙටිපොළ සටන්කාමීන්ට එකතු විය. කතරගම දී ඔටුණු පැළැඳි දොරේසාමිගේ අදිකාරම් තනතුරට කැප්පෙටිපොළ පත් කර ගනු ලැබී ය. ඔහු ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ රදල ප්‍රධානීන් සහ ජනතාව ද එකතු කොට ගෙන සිංහලේ ප්‍රථම නිදහස් සටන මෙහෙයවී ය.

කලින් සූදනමක් නොතිබුණ නමුත් උඩරට රාජ්‍යය තුළ තවත් ප්‍රදේශවල ද ඉංග්‍රීසීන්ට විරුද්ධ ව සටන පැතිර ගියේ ය. දුම්බර, හේවාහැට, සත් කෝරළය, හාරිස්පත්තුව මාතලේ සබරගමුවේ කොටසක හා නුවර කලාවියේ ද මේ සටන පැතිර ගියේ ය. මෙම සටන පැතිර නොගියේ උඩුනුවර, යටිනුවර, හතර කෝරළය හා සබරගමුවේ කොටසක වැනි ප්‍රදේශවල පමණි.

මෙම සටනේ කැප්පෙටිපොල මහ නිලමේ හැරුණු විට මඩුගල්ලේ උඩ ගබඩා නිලමේ, පිළිමතලාවේ මහ නිලමේ, කිවුලේ ගෙදර මොහොට්ටාල, කොහුකුඹුරේ රටේ රාල, බූටාවේ රටේ රාල, ඉහගම උන්නාන්සේ, නායකයෝ වූහ.

## නිදහස් සටන මර්දනය කිරීම

ඉංග්‍රීසීන්ට මෙම නිදහස් සටන් ව්‍යාපාරය මර්දනය කිරීම දුෂ්කර විය. ඉන්දියාවෙන් අමතර සේනා ගෙන්වා ගැනීමට ද ඔවුන්ට සිදු විය. සටන් සිදු වූ ඌව වෙල්ලස්ස ප්‍රදේශවල දේපල, ගෙවල්, දොරවල්, කුඹුරු, වතු පිටි ඉංග්‍රීසීන් විසින් ගිනි තබා විනාශ කරන ලදී. සටන මර්දනය කිරීමට ප්‍රධාන වශයෙන් යොදා ගත් මෙම උපක්‍රමය, බිම් පාළු ප්‍රතිපත්තිය, ලෙස හැඳින්වේ.

එසේ වුව ද ක්‍රි.ව. 1818 නිදහස් සටන ජයග්‍රාහීව අවසන් වන ලක්ෂණ දක්නට ලැබිණි. දළදා මාලිගාවේ තිබූ දන්ත ධාතුන් වහන්සේ ද අත් පත් කර ගැනීමට සටන්කරුවෝ සමත් වූහ. කලට වේලාවට ඉන්දියාවෙන් ආධාර නොලැබුණ හොත් ඉංග්‍රීසීන්ට උඩරට ප්‍රදේශ අත්හැර දැමීමට සිදුවන තත්ත්වයක් උදා වී තිබිණි. ජයග්‍රාහී විලාශයෙන් සටන ව්‍යාප්ත වූ නමුත් එය පරාජයට පත් කිරීමට ඉංග්‍රීසීහු සමත් වූහ.

## බ්‍රිතාන්‍ය විරෝධී පළමු නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු

බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහස් සටන අසාර්ථක වීමට හේතු වූ සාධක කිහිපයකි.

- සිහසුනට උරුමයක් ඇති රජ පවුලේ අයකු රජ කරවා බ්‍රිතාන්‍යයන් මේ රටින් පලවා හැර දේශයේ ස්වාධීනත්වය දිනා ගැනීම සඳහා සටන් කළ නමුත් සටන ආරම්භයේ දී හෝ සටන ඉදිරියට ගෙන යාමේ දී හෝ කිසිම විධිමත් සංවිධානයක් නොතිබිණි. එපරිද්දෙන් මෙම සටන සැලසුම් සහගත හෝ සංවිධානාත්මක හෝ එකක් නොවීම නිසා එක් එක් ප්‍රදේශවල වෙන් වෙන් ව ඇති වූ කලබල රාශියක් මෙන් දිස් විය. පොදු ව්‍යාපාරයක් ලෙස සටන ක්‍රියාත්මක නොවීම ක්‍රි.ව. 1818 නිදහස් සටන අසාර්ථක වීමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් විය.

- රදල නායකයන් ක්‍රියා කළ ආකාරයෙන් පෙනී ගියේ ඔවුන් මෙම සටනට සහභාගි වූයේ තම තමන්ගේ වරප්‍රසාද ගිලිහී යාමෙන් ඇති වූ අමනාපය නිසා බව යි. සතුරාට විරුද්ධව එක්සත් විය යුතු මේ අවස්ථාවේ දී පවා ඔවුහු තම පෞද්ගලික වාද භේද අත් නො හළහ.

  විශේෂයෙන් සතරකෝරලේ දිසාවේ වූ මොල්ලිගොඩ නිලමේ ඉංග්‍රීසීන්ට හිතවත්ව කටයුතු කෙළේ ය. ඉංග්‍රීසීන්ට කොළඹ සිට මහනුවර සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමේ දී මොල්ලිගොඩ පාලනය කළ සතර කෝරළය ඉංග්‍රීසීන්ට විරුද්ධ නොවී තිබීම ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් විය. ඒ මන්ද යත් කොළඹ සිට උඩරට බලා යන ප්‍රධාන මාර්ගය වැටී තිබුණේ සතර කෝරළය හරහා බැවින් මොල්ලිගොඩගේ පක්ෂපාතිත්වය නිසා ඉංග්‍රීසින්ට උඩරට ප්‍රදේශවල සිදු වූ සටන් පරාජය කිරීමට අවශ්‍ය වන හමුදා, ආහාර, බෙත් හේත්, අවි ආයුධ ආදිය කිසිදු බාධාවකින් තොරව උඩරට ප්‍රදේශවලට ගෙන යා හැකි විය.

- සටන් කරුවන් විසින් රජු ලෙස තෝරාගෙන සිටි දෙරේ සාමි තැනැත්තා රාජ වංශිකයෙකු නොව විල්බාවේ ගමේ සිටි උපැවිදි අයෙකු ලෙස හෙළි දරව් වීම ද සටන පරාජය වීමට හේතු විය.

- සටන පරාජය කිරීම සඳහා ඉංග්‍රීසීන් අනුගමනය කළ කෲර "බිම් පාළු" ප්‍රතිපත්තිය ද ඔවුන්ට විරුද්ධව පැන නැඟි පළමුවෙනි නිදහස් සටන පරාජය වීමට හේතු විය. දේශීය ජනතාව දහස් ගණනින් මරා දමා ගම් බිම් විනාශ කරන ලද ඉංග්‍රීසීන්ගේ ක්‍රියාකලාපය ජනතාවට ඔරොත්තු දුන්නේ නැත. එහෙයින් ඇතැම් නායකයෝ ඉංග්‍රීසින්ට භාර වූහ. සාමාන්‍ය ජනතාව කඳුකර ප්‍රදේශවලට පලා ගියහ.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහිව දියත් කළ මෙම පළමුවෙනි නිදහස් සටනේ ප්‍රතිඵල වශයෙන් කැප්පෙටිපොළ, මඩුගල්ලේ,කිවුලෙ ගෙදර මොහොට්ටාල සහ බූටෑවේ රටේ රාළ ආදී වීරෝදාර නායකයන්ට ජාතියේ නිදහස වෙනුවෙන් දිවි පිදීමට සිදු විය. තවත් බොහෝ නායකයන්ගේ දේපොළ රාජසන්තක කරනු ලැබූ අතර ඇතැම් අය රටින් පිටුවහල් කරනු ලැබීය.

ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසීන් සහ උඩරට රදළ ප්‍රධානීන් අතර ඇති වූ ගිවිසුම ක්‍රි.ව. 1818 දී ඉංග්‍රීසීහු ඒකපාර්ශික ව වෙනස් කළහ. එමගින් උඩරට ප්‍රදේශවලට ද බ්‍රිතාන්‍යයන් යටතේ මුහුදු බඩ ප්‍රදේශවල ක්‍රියාත්මක වූ අධිකරණ සහ පරිපාලන ක්‍රම හඳුන්වා දී ක්‍රි.ව. 1815 ගිවිසුමෙන් ලබා දී තිබූ පොරොන්දු සියල්ලෙන් මිදීමට ඔවුහු අවස්ථාව උදා කොට ගත්හ.

ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් ක්‍රි.ව. 1796 දී මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කොට ගනිමින් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීමට තබන ලද ආරම්භක පියවර ක්‍රි.ව. 1818 උඩරට ප්‍රකාශනයෙන් බ්‍රිතාන්‍ය බලය තහවුරු කර ගනිමින් සම්පූර්ණත්වයට පත් කෙරිණි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුමේ වැදගත්කම පිළිබඳ සඟරාවකට ලිපියක් සම්පාදනය කරන්න.
- ක්‍රි.ව. 1818 නිදහස් සටන අසාර්ථක වීමට තුඩු දුන් හේතු ලැයිස්තුගත කරන්න.
- ක්‍රි.ව. 1818 නිදහස් සටනට සම්බන්ධ වූ ජාතික වීරෝදාර පුද්ගලයන්ගේ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.